3 ඒකකය - විදුලි ජනනය(1)

✓ පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

පැවරුම 3.1

නිතර භාවිත කරන විදුලි උපකරණ සම්බන්ධයෙන් තොරතුරු දැක්වෙන 3.1 වගුව සම්පූර්ණ කරන්න.

3.1 වගුව

විදුලි උපකරණයේ නම	ප්‍රයෝජනය	උපකරණය සඳහා විදුලිය ලැබෙන ක්‍රමය
1. ඔරලෝසුව	වේලාව දැන ගැනීම	විදුලි කෝෂ
2. බත් පිසිනය	බත් පිසීම	
3. පා පැදියේ ඉදිරි ලාම්පුව		
4.		
5.		
6.		

ක්‍රියාකාරකම 3.1

3.1 රූපයේ දැක්වෙන්නේ විවිධ අවස්ථාවල දී විද්‍යුතය උත්පාදනය කිරීම සඳහා වැදගත් වන විද්‍යුත් ප්‍රභව කිහිපයකි.

3.1 රූපය ▲ විවිධ ආකාරයේ විද්‍යුත් ප්‍රභව

- එක් එක් උපකරණයෙහි විද්‍යුතය උත්පාදනය වන ආකාරය සාකච්ඡා කරන්න.
- විද්‍යුතය උත්පාදනය වන ආකාරය පදනම් කොටගෙන එම විද්‍යුත් ප්‍රභව වර්ග කරන්න.